# නිවන පිහිටියේ කොහි ද ?

ත්‍රිපිටකවේදී උපාධි අපේක්ෂක

**බෝගහපිටියේ ධම්මාරාම හිමි**

සෑම ආගමක ම පරම නිෂ්ඨාවක් ඇත. එම අලෞකික තත්වය සාක්ෂාත් කර ගැනීමට මඟ හෙළි පෙහෙළි කිරීම ආගම් මගින් සිදුකෙරේ.

හින්දු ධර්මයේ පරම නිෂ්ඨාව බ්‍රහ්මත්වයයි
නිගණ්ඨ ධර්මයේ පරම නිෂ්ඨාව කෛවල්‍ය පදයයි
ක්‍රිස්තු භක්තිකයන්ගේ පරම නිෂ්ඨාව ස්වර්ගයයි
බුදු දහමේ පරම නිෂ්ඨාව නිර්වාණයයි

මේ සෑම ආගමකින්ම පෙන්වා දෙනු ලබන පරම නිෂ්ඨාව හෙවත් මෝක්ෂය අධිභෞතික ස්වරූපයක් ගෙන ඇත. මෙහිදී සිහිකටයුත්තක් නම් තීරණ ගැනීමේදී ප්‍රත්‍යක්ෂ මෙන්ම අනුමානයද වැදගත් බවයි.

බුදු දහමේ එන නිර්වාණය අප්‍රත්‍යක්ෂයයි ඉවතලිය හැකි නොවේ. නිර්වාණය අවබෝධ කළයුත්තේ එයට ඇති මාවතේම ගමන් කිරීමෙනි. ප්‍රත්‍යක්ෂයෙන් අප්‍රත්‍යක්ෂය කරා යා යුතුය.

නිර්වාණය අභිධර්ම ප්‍රත්‍යක්ෂයෙන් වුවද දියහැකි මගක් ඇත. එයට ලෝකෝත්තර ප්‍රඥෙන්ද්‍රියය අවශ්‍යය. එය ඉන්ද්‍රිය විභාගයේදී—

" අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය
අඤ්ඤින්ද්‍රිය
අඤ්ඤාතාවින්ද්‍රිය

යනුවෙන් ආකාර තුනක් ලෙස දක්වා තිබේ. මේ ඉන්ද්‍රිය තුන ආර්‍ය්‍ය පුද්ගලයන්ට පමණක් පහළවන නිසා පෘථග්ජනයන්ට අවිෂය වේ.

බුදු දහමේ හරය ලෙස සැලකිය හැකි මෙම අලෞකික තත්වය පිහිටි ස්ථානය පිළිබඳ ප්‍රශ්නය බොහෝ කලක සිට පැන නැගෙන්නකි.

මිළිඳු රජු නාගසේන හිමියන්ගෙන්ද නිවන පිහිටි දිශාව පිළිබඳ ප්‍රශ්න කර ඇත. එහිදී නාගසේන හිමියන්ගේ පිළිතුර වූයේ නිවන පිහිටි තැනක් දිශාවක් නැත යනුයි. තැනක් දිශාවක් නැත්නම් නිවනය කියා තිබිය යුතු දෙයක්ද නැතැයි ප්‍රශ්න නැගෙන්නට විය.

එයට පිළිතුර වූයේ ගින්න පිහිටි තැනක් නොමැති වුවත් ලී දෙකක් එකට ගැටීමෙන් ගිනි හට ගන්නාක් මෙන් මනා කොට පිළිපැදීමෙන් යෝනිසෝ මනසිකාරයෙන් නිවන අවබෝධ කර ගන්නා බවයි. දීඝ නිකායේ කේවට්ට සූත්‍රයට අනුව නිවන පිහිටි ස්ථානය ඇසින් දත නොහැක. මාර්ග ඥාන සංඛ්‍යාත විශිෂ්ඨ ඥානයෙන්ම දත යුතුය.

සමාන කිරීමටද වස්තුවක් නැත. මදක් හෝ පැහැදිලි වීමට පර්‍ය්‍යාය වචන යොදා ගනු ලැබේ එහෙත් එයින් සිදු වන්නේ අලෞකික වස්තුවක් ලඝුකොට දැක්වීමයි.

නිවන හැම ස්ථානයකම පිහිටි සතර මහා භූතයින්ගෙන් තොර වස්තුවක් ලෙස දීඝ නිකාය අටුවාව දක්වා ඇත.

" සබ්බතො වා පභූතමෙවා කත්ථචි න නත්ථීති සබ්බතොපභා " යනුවෙනි.

මෙම අදහසටම සමානවූ දේශනාවක් ලෙස නිවන බඹයක් පමණ සිරුර ආශ්‍රිතව ඇතැයි යන්න දැක්විය හැකිය.

සංස්කාරයන් නොමැති නිවනෙහි පැවැත්මක් බලාපොරොත්තු විය නොහැක. එය ලෝකයට අයත් නො වූවක් හෙයිනි. මෙම අපූරු ස්ථානය ඇති තැනක් නැත. නැති තැනක් නැත. පරම සූක්ෂ්ම ධාතුවෙකි.

නිවන පිහිටි ස්ථානය ගැන මහාකවි අශ්වඝෝෂ හිමියන් සෞන්දරනන්ද කාව්‍යයේදී දක්වා ඇති අදහස ඉතා වැදගත් වේ. පහනෙහි තෙල් අවසන් වීමෙන් හුදෙක් නිවීමට යන්නාසේ කෙලෙසුන් ක්ෂය වීමෙන් ශාන්තියට පැමිණේ. පහනෙහි දැල්ල කුමන දිශාවකට ගියේද යනු ප්‍රශ්නයක් නොවේ.


ආශ්‍රිත ග්‍රන්ථ :—

මිලින්ද පඤ්හ
මහායානය—රාහුල හිමි, මහානාම හිමි
දීඝ නිකාය : කේවට්ට සූත්ත
දීඝ නිකාය අටුවාව